# INTERNATIONAL COMMISSION OF JURISTS

Commission internationale de juristes - Comisión Internacional de Juristas

*" dedicated since 1952 to the primacy, coherence and implementation of international law and principles that advance human rights "*


**COMMUNIQUE DE PRESSE - COMUNICADO DE PRENSA**

PRESS RELEASE

2006.12.15

## ප්‍රවෘත්ති නිවේදනය

## ත්‍රස්තවාදයට එරෙහි නව රෙගුලාසි ප්‍රමාණවත් වෙනස්කම්වලට භාජනය කරන ලෙස ජාත්‍යන්තර නීතිවේදීන්ගේ කොමිසම (ICJ) ශ්‍රී ලංකා රජයෙන් සහ පාර්ලිමේන්තුවෙන් ඉල්ලා සිටියි.

සාමකාමී හා නීත්‍යනුකූල ක්‍රියාකාරකම් අපරාධ බවට පත්නොකිරීම සහතික කරනු සඳහාත්, නීතියේ ආධිපත්‍යයට ගරු කරනු සඳහාත් 2006 දෙසැම්බර් 6 වැනිදා ජනාධිපතිවරයා විසින් පනවන ලද ත්‍රස්තවාදයට එරෙහි නව රෙගුලාසි සංශෝධනය කරන ලෙස ජාත්‍යන්තර නීතිවේදීන්ගේ කොමිසම (ICJ) ශ්‍රී ලංකා රජයෙන් හා පාර්ලිමේන්තුවෙන් ඉල්ලා සිටියි.

“මෙම රෙගුලාසි විසින් පුළුල් ලෙස අර්ථ නිරූපණය වූ ත්‍රස්තවාදී වැරදි නිර්මාණය කරන අතර, ඒවා නිත්‍යනුකුල ලෙස අපරාධීකරණය  කළ හැකි පිළිගත් ත්‍රස්තවාදී ක්‍රියාවන්ගෙන් ඔබ්බට විහිදෙන  බව” ජාත්‍යන්තර නීතිවේදීන්ගේ කොමිසමේ ගෝලීය ආරක්ෂාව හා නීතියේ  ආධිපත්‍යය පිළිබඳ වැඩසටහනේ අධ්‍යක්ෂ ජෙරල්ඩ් ස්ටබෙරොක් ( Gerald Staberock) පවසයි.

“වෙනත් අය අතර, සාමකාමී උද්ඝෝෂකයන්ට, අර්බුදය  නිරාකරණය කරන්නට සාමකාමී ලෙස ප්‍රයත්න දරන්නන්ට, මානවවාදී ආධාරකරුවන්ට, මානව හිමිකම් ක්‍රියාකාරිකයන්ට සහ ජනමාධ්‍යවේදීන්ට එරෙහිව චෝදනා නගන්නට මෙම රෙගුලාසි යොමුවිය හැකියැ”යි ඔහු අවධාරණය කරයි.

“සැබවින්ම, රටේ උතුරු සහ නැගෙනහිර සමග සම්බන්ධතා පවත්වන කිසිවකු  හෝ ත්‍රස්තවාදය සඳහා සැකකැරුණු කිසිවකු සමග ඉතා ඈතින් සම්බන්ධතා පැවැත්වූවකු ත්‍රස්තවාදී සැකකරුවකු ලෙස සැලකීමට ඉඩ සැලසෙයි.”

විශේෂයෙන් ජුනි මාසයේදී කැබිතිගොල්ලෑවේ සිවිල් වැසියන් 68 දෙනෙකු ක්ලේමෝ බෝම්බයකට හසුවී ඝාතනය වීම, අගෝස්තු මාසයේදී රජයේ සාම ක්‍රියාවලිය සම්බන්ධීකරණය කිරීමේ ලේකම් කාර්යාලයේ නියෝජ්‍ය ලේකම් කොළඹදී ඝාතනය කිරීම, දෙසැම්බර් මාසයේදී ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයාට කොළඹ දී එල්ලවූ මරාගෙන මැරෙන ප්‍රහාරය වැනි ආසන්න ප්‍රචණ්ඩ ප්‍රහාරයන්  සැලකිල්ලට ගත්විට ශ්‍රී ලංකාව බරපතළ ආරක්ෂක තර්ජනයන්ට මුහුණ දී සිටින බව ICJ පිළිගනියි.

කෙසේ වෙතත්, ආරක්ෂක නීති, විශේෂයෙන්, නව අපරාධ වැරදි ස්ථාපනය කරන ආරක්ෂක නීති අත්‍යවශ්‍යයෙන්ම නෛතික මූලධර්මවලට අනුකූල විය යුතුය: තමන් කරන ක්‍රියාවන් අපරාධ ක්‍රියාවක් වන්නේද නැද්ද යන්න ජනතාව පැහැදිලිව දැනගත යුතුය. තවද, ප්‍රකාශනයේ, රැස්වීමේ සහ සමාගමයේ නිදහස වැනි ආණ්ඩුක්‍රම  ව්‍යවස්ථාමය අයිතිවාසිකම් නීත්‍යනුකූල ලෙස ක්‍රියාවේ යෙදවීම නීතිය මගින් අපරාධ බවට පත් නොකළ යුතුය.

“දේශපාලන හෝ ආණ්ඩු වෙනසක්” හෝ “යම් ක්‍රියාවක් සිදුකිරීමට හෝ සිදු කිරීමෙන් වැලකී සිටීමට ආණ්ඩුවට බලපෑම් කිරීමේ’’ අරමුණෙන් සිදුකෙරෙන මහජන සාමයට බාධා කරන්නාවූ

ක්‍රියා මෙම රෙගුලාසි මගින් අපරාධ බවට පත්කෙරෙයි. සාමකාමී උද්ඝෝෂණ හෝ කර්මාන්ත වර්ජනයන් සංවිධානය කිරීම හෝ ඒවාට සහභාගිවීම වැනි නීත්‍යනුකූල ක්‍රියාවන් ඉතා පහසුවෙන් එවැනි පුළුල් භාෂා යෙදුම්වලට ඇතුළු කළ හැකිය.

තවද මෙම රෙගුලාසි මගින්, ත්‍රස්තවාදීන්යැ'යි සැකකරන පුද්ගලයනට උදව් කරන, එහෙත් තම ක්‍රියා මගින් එම ප්‍රතිඵලය ඇතිවේයැ'යි පූර්ව දැනුමක් හෝ චේතනාවක් නැති පුද්ගලයන් වැරදිකරුවන් කිරීමට දොරටු විවෘත කරයි. උදාහරණයක් ලෙස මෙම රෙගුලාසි මගින් ( රෙගුලාසිවල අර්ථ දක්වා ඇති අන්දමට) ත්‍රස්තවාදයේ නියැලී සිටින පුද්ගලයකුට හෝ කණ්ඩායමකට නොදැනුවත්කමින් සහයෝගය දක්වන, උපදෙස් දෙන, උනන්දුකරන, ප්‍රවර්ධනය කරන, හෝ උදව්කරන පුද්ගලයකු අවුරුදු 5 සිට 10 දක්වා සිරදඬුවමකට යටත් කළ හැකිය.

"අන්තර්ජාතික නීතියට අනුව ප්‍රචණ්ඩ ක්‍රියා, වාර්ගික වෛරය, සහ ත්‍රස්තවාදී ක්‍රියා සඳහා අන් අය පොළඹවන පුද්ගලයන්ට එරෙහිව චෝදනා ඉදිරිපත් කිරීමට රජයකට අයිතියක් තිබේ. එහෙත්, මෙම රෙගුලාසි මගින් ත්‍රස්තවාදී ක්‍රියාවකට කවරාකාරයෙන් හෝ චෝදනා ලැබ සිටින පුද්ගලයකු එසේ කිරීමට චේතනාන්විතව ක්‍රියා කළ යුතු බව පැහැදිලිව සඳහන් නොකරයි. මෙම රෙගුලාසි මගින් ශ්‍රී ලංකාවේ අර්බුදය සම්බන්ධයෙන් විවෘත හා ඇතැම් විට මතභේදාත්මක විවාදයක් ඇතිකිරීමේ තර්ජනයක් තිබෙන බව" ද ජෙරල්ඩ් ස්ටබෙරොක් ප්‍රකාශ කරයි.

මෙම රෙගුලාසි මානවවාදී සහායයන්ට, අර්බුදය නිරාකරණය කිරීමේ ප්‍රයත්නයන්ට හා මානව හිමිකම් ක්‍රියාවලියට අයහපත් බලපෑමක් ඇතිකළ හැකි බව ICJ සැලකිල්ලට ගනියි. රෙගුලාසි යටතේ ත්‍රස්තවාදය හෝ විශේෂිත ත්‍රස්තවාදී ක්‍රියාකාරකම්වල යෙදිය හැකි යම් පුද්ගලයකු හෝ කණ්ඩායමක් සමග ගනුදෙනු කිරීමට ප්‍රථම දේශීය හා අන්තර්ජාතික සංවිධාන 'නිසි බලධාරියකු'ගෙන් ලිඛිත පූර්ව අනුමැතියක් ලබාගත යුතුය. මෙය උතුරු හා නැගෙනහිර ප්‍රදේශවල ආධාර හා සහාය සපයන ආයතනවලට බලපායි.

"උතුරු නැගෙනහිර පළාත්වල බොහෝ සිවිල් ජනතාව සිය පැවැත්ම සඳහා දේශීය හා අන්තර්ජාතික ආයතනවල මානවවාදී සහායයන් මත රඳා සිටිති. මෙම අත්‍යවශ්‍ය සංවිධානවලට තවදුරටත් ඔවුන්ගේ නීත්‍යනුකූල ක්‍රියාකාරකම් බාධාවකින් තොරව පවත්වා ගෙන යෑමට ඇති හැකියාව තහවුරු කරන ලෙස අප බලධාරීන්ගෙන් ඉල්ලා සිටින්නේයැ"යි ජෙරල්ඩ් ස්ටබෙරොක් පවසයි.

නිසි බලධාරියාගේ තීරණ සම්බන්ධයෙන් අභියෝග කළ හැකි 'අභියාචනා විනිශ්චය අධිකාරය'ක් රෙගුලාසි යටතේ පිහිටුවනු ලැබ ඇත. කෙසේ වුවද කිසියම් අභියාචන කාර්යාවලියක් ක්‍රියාත්මක කළ යුත්තේ පිළිගත් පාරදෘශ්‍ය හා සාධාරණ කාර්ය පටිපාටියක් අනුගමනය කරන ස්වාධීන හා අපක්ෂපාතී අධිකරණ මණ්ඩලයක් විසින් පමණි. ප්‍රධාන රාජ්‍ය අමාත්‍යාංශවල නියෝජිතයන්ගෙන් සමන්විත වන "අභියාචන විනිශ්චය අධිකාරිය" පැහැදිලිවම මෙම ප්‍රමිතීන්ට නොගැලපෙයි.

ඒ හා සමානව සැලකිල්ලක් දැක්විය යුතු කරුණක් වන්නේ, මෙම රෙගුලාසි ක්‍රියාත්මක කිරීමේදී රජයේ නිලධාරීන් විසින් සිදුවිය හැකි වැරදි ක්‍රියා සම්බන්ධයෙන් කිසිම නීතිමය ක්‍රියාමාර්ගයක් ගැනීමෙන් වළක්වන පූර්ණ නිර්මුක්තියක් ඇතුළත් කර තිබීමය. යම් නිලධාරියකු සද්භාවයෙන් ක්‍රියාකර ඇත්නම් හා ඔහුගේ රාජකාරි කටයුතු අතරතුරදී ක්‍රියාකර ඇත්නම් නීතිමය ක්‍රියාමාර්ගයන් අවහිර වනු ඇත. මෙම නිර්මුක්තිය ශ්‍රී ලංකාවේ අනෙකුත් නීතිවල ඇති සමාන ප්‍රතිපාදන ප්‍රතිරාව කරන අතර ලංකාවේ පවතින දඬුවම් වලින් බේරී සිටීමේ සංස්කෘතිය තවදුරටත් ආරක්ෂාකිරීම පමණක් සිදුකරයි.

මෙම රෙගුලාසි සම්බන්ධයෙන් අර්ථාන්විත හා පාරදෘශ්‍ය සංවාදයකට එළඹෙන ලෙස ජාත්‍යන්තර නීතිවේදීන්ගේ කොමිසම පාර්ලිමේන්තුවෙන් ඉල්ලා සිටියි. මෙම රෙගුලාසි නීතියේ පාලනයට හා ශ්‍රී ලංකාවේ මානව හිමිකම් පිළිබඳ වගකීම්වලට එකඟවන ආකාරයෙන් සාධාරණ හා යුක්ති සහගත කිරීම සඳහා ප්‍රමාණවත් වෙනස්කම් කළ යුතුය.

වැඩි විස්තර සඳහා අමතන්න: Laila Karimi 00 41 22 979 3818